**ශීර්ෂය 162 - මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාරශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම**

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | චක්‍රලේඛයේ 7 (vi) ඡේදයේ උපදෙස් වලට පටහැනිව 2019 දෙසැම්බර් 31 දිනට ගැලපුම් කිරීමට පෙර අග්‍රිම ගිණුමේ ශේෂයට හර නොකල යුතු රු.1,610,236 ක ශේෂයක් හර කර තිබූ අතර බැරට සටහන් නොකලයුතු රු.1610,236 ක ශේෂයක් බැර කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද විගණන නිරීක්ෂණවලට අනුව අදාල ගැලපීම් සිදුකර 2019 වර්ෂයේ ගිණුම් වාර්තා පිළියෙල කර ඇත. |
| (ආ) | චක්‍රලේඛයේ 3.6 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට හර කල යුතු තැන්පතු ලැබීම් රු.1,140,917,026 ක් හා බැරකලයුතු තැන්පතු ගෙවීම් රු.141,921,563ක් ඇතුලත් කර මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | -එම- | 2019 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ විගණකාධිපතිවරයාගේ 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද විගණන නිරීක්ෂණවලට අනුවය. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සහනාධාර හා මාරුකිරීම් වටිනාකම රු.1,157,559 ක් වුවද, එය රු.30,151,648,300 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා සහනාධාර හා මාරුකිරීම් වටිනාකම රු.30,150,490,741 වැඩියෙන් දැක්වුණි. | නිවැරදි දත්ත ගිණුම් ප්‍රකාශන තුල ඇතුලත් කල යුතුය. | වර්ෂ ය අවසන් වන විට කෙරීගෙන යන වැඩ (work in progress) යටතේ වන වටිනාකම මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ සහනාධාර මාරු කිරීම් යටතේ ගැලපීම් කර ඇත. මෙය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපීම් කිරීමට සැලසුම් කර ඇත. |

**1.6.3** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරනු ලබන අවසන් මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව අනුව අමාත්‍යාංශයේ කාර්යාල ගොඩනැගිලි ලෙස රු.362,238,833 ක ශේෂයක් පෙන්නුම් කලද, එම ශේෂය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය තුල ඇතුලත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අවසන් ශේෂය රු.362,238,833 ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරනු ලබන අවසන් මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82 ) අනුව අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ශේෂවල ගැලපීම් කළ යුතුය. | මෙය වර්ෂය අවසන් වන විට කෙරීගෙන යන වැඩ (work in progress) යටතේ වන වටිනාකමක් බැවින් එය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුලත් කර නැත. එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සහනාධාර ගැලපීම් යටතේ දක්වා ඇත. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී අදාල වර්ගීකරණය නිවැරදිව සිදු කිරීමට සටහන් කරගෙන ඇත. |

**1.6.4** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් සපයන ලද මාසික ගිණුම් සාරාංශ සහ සහ අනෙකුත් තොරතුරු අනුව ආදායම් නොවන ලැබීම් රු.82,285,848 ක් වුවද එය රු1,223,202,874ක් ලෙස සටහන් කිරීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය රු.1,140,917,026 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල තැන්පතු ලැබීම් සටහන් කිරීම සඳහා ස්ථානයක් වෙන්කර ඇති බැවින් තැන්පතු නොවන ලැබීම්, ආදායම් ලැබීම් තුල සටහන් කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය නොවේ. | ආදායම් නොවන ලැබීම් රු.1,223,202,874 තුල තැම්පත් ලැබීම් රු.1,140,917,027 ක් හා වෙනත් ලැබීම් රු.82,285,848 ක් ඇතුලත් වේ. එම මුළු මුදලම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්ය. තැන්පත් ලැබීම් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් නොවන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.1,140,917,026 ක් වැඩියෙන් දැක්වීමක් නොවේ. |
| (ආ) | භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදීගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම රු.367,065,885ක් වුවද එය රු.4,827,052ක් ලෙස සටහන් කිරීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.362,238,833 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි දත්ත ගිණුම් ප්‍රකාශන තුල ඇතුලත් කල යුතුය. | වර්ෂය අවසන් වන විට කෙරීගෙන යන වැඩ (work in progress) යටතේ වන වටිනාකමක් බැවින් එම මුදල මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ සහනාධාර මාරු කිරීම් යටතේ ගැලපීම් කර ඇත. මෙම ගැලපීම 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපීම් කිරීමට සැලසුම් කර ඇත. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103 හා 104** | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පවතින RTC උප ව්‍යාපෘතිය වෙත නිකුත් කර තිබුණු රු. 231,409 ක් වටිනාකමැති වර්ෂාමානක සූර්යපැනල සහ සන්නිවේදන උපකරණ (IoT Controller & Solar Pannel with mount) 03ක් 2019 ජුනි 14,26 හා ජුලි 11 දිනවල නැතිවී තිබුණද එම අලාභහානි සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය සතු සම්පත්වල අලාභය සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතිය විසින් කිතුල්ගල, ඇහැළියගොඩ හා මෝදර යන ප්‍රදේශවල සවි කර තිබුණු වර්ෂාමානක සූර්යපැනල සහ සන්නිවේදන උපකරණ (IoT Controller & Solar Pannel with mount) 03ක් අස්ථානගතවී ඇති අතර ඉන් රජයට සිදු වී ඇති පාඩුව රු. 231,409.28 ක් ලෙස ගනන් බලා ඇත. මෙම අලාභහානි පිළිබඳව කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය විසින් එම උපකරණ සවිකර තිබූ ප්‍රදේශ බාර පොලිස් ස්ථාන වලට පැමිණිලි කර ඇත. පොලිස් විමර්ෂණ සිදුවන අතරතුර ව්‍යාපෘතිය මගින් පත්කල කමිටුවක් මඟින්ද විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලදි. එම කමිටුව විසින් කරන ලද පරීක්ෂණයේ නිර්දේශ ඇතුලත් වාර්තාව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉදිරි කටයුතු වෙනුවෙන් උපදෙස් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ**<br>2016 ජනවාරි 01 දිනැති අංක ඕඑම්ඒ/එස්පී/2015/01 දරන කළමණාකරණ විගණන දෙපාර්තෙමින්තුවේ චක්‍රලේඛය | අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ව්‍යාපෘති කාර්යාල සතු වාහන පිළිබඳ සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාහන සම්බන්ධ සමීක්ෂණ පවත්වා එම වාර්තා විගණනයට ඉදිරිපත් කල යුතුය. | අමාත්‍යාංශය හා ව්‍යාපෘති කාර්යාල වල ඇති වාහන සම්බන්ධව 2020 වර්ෂය සඳහා සමීක්ෂණය කිරීම සඳහා වන මණ්ඩල මේ වන විටත් පත් කර ඇත. අදාල කාර්යයන් අවසන් වූ වහාම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 03 ක් සඳහා සහ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.642,050,000 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | වියදම් ඇස්තමේන්තු තාත්ත්විකව පිළියෙල කල යුතුය. | නිරීක්ෂණ සමග එකග වේ. ප්‍රතිපාදන ඉතිරි වීම භාණ්ඩාගාරය විසින් අක් මුදල් නිදහස් කිරීම අඩුකම මත ප්‍රතිපාදන උපයෝජනය වී නොමැති වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 14 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.125,993,000 ක් වූ ප්‍රතිපාදන වලින් රු.22,751,339 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 49 දක්වා පරාසයක පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැයවිෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.10,236,550,000 ක් වූ ප්‍රතිපාදන වලින් රු.5,666,278,465 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 81 දක්වා පරාසයක පැවතුණි. | -එම- | -එම- |
| (ඈ) | සංවර්ධන උප ව්‍යාපෘති 12 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් ලබාදී තිබුණු රු.10,058,000,000 ක ප්‍රතිපාදන වලින් රු.8,999,484,665 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 40 ත් 100 ත් අතර පරාසයක විය. | -එම- | නිරීක්ෂණ සමග එකගවේ |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 ක් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 54 ත් 90 ත් අතර ප්‍රමාණයකින් මු.රෙ.66 ප්‍රතිපාදන මාරුකිරීම් යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. ඒ අනුව එම වැය විෂයයන් සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සැලසීම ඵලරහිත වී තිබුණි. | -එම- | පුරෝකතනයන් මත කරන ලද ඇස්තමේන්තුගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යාමේදී ප්‍රායෝගිකව සිදුවන ගැටළු මත යම් යම් වියදම් පැන නොනැගීම මත ප්‍රතිපාදන ඉතිරි වීම. |

| | | |
|---|---|---|
| (ඊ) විදේශිය අරමුදල් ව්‍යාපෘති 03 ක් වෙත වෙන්කරන ලද රු. 815,000,000 ක් වෙනත් දේශිය අරමුදල් ව්‍යාපෘතින් වෙත මාරු කර තිබුණි. | -එම- | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉතිරි ව්‍යාපෘති වලින් මුදල් රෙගුලාසි අනුව ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ ව්‍යාපෘති වෙත මාරු කිරීම් සිදුකර ඇත. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඈ) ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියළුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කල යුතු අතර, කිසිදු බැරකමක් ඊළග වර්ෂය තුල නිරවුල් කිරිමේ අරමුණ ඇතිව ඉදිරියට තබාගැනීමක් නොකල යුතු නමුත් 2019 මුල්‍ය ප්‍රකාශනවල රු. 7,338,750,293 ක බැරකම් ශේෂ එසේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඈ) ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිරීක්ෂණ සමග එකගවේ. ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත බැරකම් ඉදිරියට ගෙයාමට සිදුවී ඇත. |
| (ආ) ඉහත චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂාවසානයට බැරකම් නොතිබිය යුතුව තිබුණත්, 2019 වර්ෂයට ප්‍රතිපාදන රහිතව වැය විෂය 02 ක් වෙනුවෙන් රු. 161,049,236 ක බැරකම් වලට එළඹ තිබුණි. | -එම- | නිරීක්ෂණ සමහ එකහ වේ. නිරීක්ෂණය මගින් දක්වා ඇති අදාල වැය විෂයන් දෙකම විදේශ ව්‍යාපෘති වලට අදාල වේ. මෙම ව්‍යාපෘති මගින් ඉටුකරන වැඩ වල කාලය වර්ෂ කිහිපයකට ඇදී යන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසු ගිවිසුම්ගත වූ වර්ෂය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වල යම් හිඟතාවයක් තිබුණත් ව්‍යාපෘති කටයුතු අතරමඟ නතර කර දැමීමට හැකියාවක් නොමැත. එබැවින් ව්‍යාපෘති දිගටම ක්‍රියාවට නංවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පැවති උප ව්‍යාපෘතීන් 04 ක් 2019 වර්ෂය තුල නිම කිරීමට ඉලක්ක කර තිබුණු නමුත් එම කටයුතු ඉටුකර නොතිබුණි. | සැලසුම් කල ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. | ව්‍යාපෘතිය මගින් සැලසුම් කර තිබූ ව්‍යාපෘති යම් යම් පාලනය කල නොහැකි හේතු මත සැලසුම් කල කාලය තුල ඉටු කිරීමට නොහැකි විය. |
| (ආ) 2015 වර්ෂයේදී රු. 1,000,575 ක මුදලක් දරා ව්‍යාපෘති කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ගිණුම් තැබීමේ හා ව්‍යාපෘති සමාලෝචන පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට වැයකර තිබුණද 2020 ජුනි 30 දිනය දක්වාම එනම් ව්‍යාපෘති කාලය අවසන් වීමට මාස 15 ක් පමණක් ඉතිරිව තිබියදීත් අදාල මෘදුකාංගය ස්ථාපිත කර නොතිබුණි. | මෙවැනි නිෂ්කාර්ය වියදම් සඳහා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගත යුතු වීම. | අදාල ආයතනය සමඟ සම්බන්ධ වී මූල්‍යමය මොඩියුලය යාවත්කාලීන කර භාවිතයට ගැනීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දැනුම් දී ඇත. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර ව්‍යාපෘතියේ ක්‍රියාකාරි සැලැස්මට අනුව, ව්‍යාපෘති හඳුනාගැනීම, ශක්‍යතා අධ්‍යනයන් සහ පරිසර බලපෑම් තක්සේරු වාර්තා ලබාගැනීමට යන කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සම්බන්ධීකරණ හා කළමනාකරණ ඒකකයෙන් පහසුවෙන්ම කරගැනීමේ හැකියාව පැවතුණි. එහෙත් එම කාර්යය සඳහා වෙනමම ව්‍යාපෘති කළමනාකරණ උප | ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට අපේක්ෂිත සංවර්ධන කාර්යයන් ඉටුකරගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සපයාගැනීමේ මූලාශ්‍ර හඳුනාගැනීමෙන් පසුව සහ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන සහ පරිසර බලපෑම් වාර්තා සහ අවසාන සැලසුම් | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018 මාර්තු 19 වන දිනැති අංක DMS/7777/MMWD/Project දරණ ලිපියෙන් බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් කාර්ය මණ්ඩල බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉල්ලුම්කර තිබූ තනතුරු 38 අනුමත කර එවා ඇත. එසේම මෙම ව්‍යාපෘතිය |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයක් ආරම්භ කොට නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, ඉංජිනේරුවරු තිදෙනෙකු, නගර සැලසුම්කරුවෙකු ඇතුළු නිලධාරින් 20 ක් බඳවාගෙන තිබුණි. එකී ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන සහ පරිසර බලපෑම් වාර්තා සහ අවසාන සැලසුම් වාර්තාවන් මෙතෙක් සකස් කර නොතිබු අතර 2017 හා 2018 වර්ෂ තුළ බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ, ව්‍යාපෘති කාර්යාලයට අනුයුක්ත කාර්යමණ්ඩලයට වැටුප් ගෙවමින් කාර්යාලය පවත්වාගෙන යාමට රු.44,270,907 ක් වැයකර තිබුණි. ඊට අමතරව ගොඩනැගිලි කුලී, විදුලි වියදම් ඇතුළු අනෙකුත් වියදම් ද සැලකිල්ලට ගත් විට රු. මිලියන 50 කට අධික වියදමක් මේ වෙනුවෙන් වැයකර ඇතත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකිරිමට අපේක්ෂිත සංවර්ධන කාර්යයන් ඉටුකරගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් මෙතෙක් සොයාගැනීමට නොහැකිවී තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතියද 2020 ඔක්තෝබර් 31 දින අවසන් කර, එම ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලද කටයුතු නාගරික සංවර්ධන අධිකාරියේ භාරයට පත්කර තිබුණි. | වාර්තාවන් සකස් කිරීමෙන් අනතුරුව පමණක් ව්‍යාපෘති කාර්යාල ආරම්භ කල යුතුය. | සඳහා ඉහත අනුමත තනතුරු වලින් නිලධාරීන් 20ක් පමණක් අවශ්‍යතාවයට අනුව බඳවාගෙන ඇත.<br>ව්‍යාපෘතිය සඳහා ඉහත දක්වා ඇති පරිදි නිලධාරීන් බඳවාගෙන ඔවුන් මඟින් සාමුහිකව ව්‍යාපෘතියේ ඉහළ ප්‍රමිතියෙන් යුතු මූලික ශක්‍යතා අධ්‍යයනයක් සංකල්පීය සැලැසුම් හා අනෙකුත් අදාළ වාර්තාවන් නිම කර ඇත. එබැවින් බඳවාගත් නිලධාරීන් හට කල යුතු ප්‍රමාණවත් වැඩකොටස් ඔවුන්වෙතින් ව්‍යාපෘතිය වෙත ලැබී ඇත. තවද කොල්ලුපිටියේ සිට දෙහිවල ඇල දක්වා වෙරළ තීරය ව්‍යාපෘතිය සම්බන්ධව කිසිදු බාහිර වියදමක් නොමැතිව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් ගුණාත්මක භාවයෙන් යුතු ඉහළ ත්‍රිමාණ වීඩියෝ පටයක්ද නිර්මාණය කර ඇත. ඔවුනට බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් පවරා ඇති රාජකාරී සහ වගකීම් අනුව ඒ ඒ අවස්ථාවට උචිත පරිදි පැවරෙන කාර්යභාරය සිදුකරනු ලබන අතර ඔවුනට පවරා ඇති රාජකාරී සහ වගකීම් වෙන් වෙන්ව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් පවරා තිබුණි. 2020.10.31 දින සිට මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර, එම ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලද ව්‍යාපෘති නාගරික සංවර්ධන අධිකාරියේ භාරයට පත්කර ඇත. |
| (ආ) | කොළඹ නගරයේ අධික රථවාහන තදබදයට විසඳුමක් සැපයීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතියක් වන මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - නගර සංවර්ධන සංරචකය (3K ව්‍යාපෘතිය) සඳහා අන්තර්ජාතික ජපන් බැංකුව (JICA) හා ශ්‍රී ලංකා රජය අතර 2007 වර්ෂයේදී ඇතිකරගත් පූර්ණකාලීන ණය | ව්‍යාපෘතීන් ආරම්භකිරීමේ මූලික අරමුණු ඉටුකිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය නියමිත කාලසීමාව තුල නිම කිරීමට කටයුතු කල යුතුය. | මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමට ඉඩම් සංවර්ධන කාර්යයන් අවසන් කර, බස් පර්යන්තය ඉදිකිරීම ආරම්භ කරන විට JICA ආයතනයේ ලබා දී තිබූ සම්පූර්ණ මුදල උපයෝජනය කර අවසන් විය. එහිදී සංවර්ධන කාර්යයන් අවසන් කිරීමට දේශීය අරමුදල් ලබා දීම |

| | | |
|---|---|---|
| ගිවිසුමක් අනුව මුල්‍යානය කරමින් පැවතුණි. 2015 මැයි මස මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබු අතර ඒ වන විට JICA ආයතනයෙන් සැපයීමට එකඟ ව තිබූ මුළු මුදල උපයෝජනය කර තිබුණි. එදිනෙන් පසුවද භාණ්ඩාගාර ප්‍රතිපාදන මත තවදුරටත් ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරමින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පවත්වාගෙන ගොස් තිබුණි. ව්‍යාපෘතිය නියමිත කාල වකවානුව තුල නිම නොකිරීම මත ඉකුත් වර්ෂ 4 ½ තුල භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු.මිලියන 110 කට අධික මුදලක් ව්‍යාපෘතියේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු සඳහා වැයකර තිබුණි. | | සිදු කල යුතු බවට වූ එකගතාවය මත අදාල ප්‍රතිපාදන අනුමත විය.<br>මූලික ඉදිකිරීම් කාර්යයන් 2018 අවසන් වූ අතර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ අවශ්‍යය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2018 වසරේ රේඛීය අමාත්‍යාංශය මගින් ව්‍යාපෘතිය වෙත සිදුකරන ලද දැනුම්දීමට අනුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත එම සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී. සංවර්ධන කාර්යයන් සිදු කරන අතරතුර මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ප්‍රවාහන සැලසුම් ක්‍රියාත්මක කිරීමට සිදුවිය.<br>බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා වන<br><br>ආයතන ව්‍යුහයක් නොතිබීමත්, ඒ සඳහා වන විධිමත් ආයතන ව්‍යුහයන් පැවතීම අත්‍යවශ්‍ය වීමත් මත එය සකස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. එම කාලසීමාව තුල මෙහෙයුම් කටයුතුද ව්‍යාපෘතිය මගින්ම ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදි.<br>දේශීය අරමුදල් මගින් 2015 මැයි මස සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර, අවම සේවක සංඛ්‍යාවක් උපයෝගී කොට ගෙන ඉතා අවම පිරිවැයක් පරිපාලනමය කටයුතු වෙනුවෙන් වැය කර ඇත. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම, යෝජිත වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම්, කිඹුලා ඇල (බිලුමැන්ඩල්) ප්‍රදේශය සංවර්ධනය | අතහැර දමන ලද ව්‍යාපෘති ඉටුකිරීමට පියවර ගත යුතුය. | **කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම සඳහා** ශක්‍යතා අධ්‍යයනයක් සහ අදාල සංවර්ධන |

| | | | |
|---|---|---|---|
| | කිරීම සහ යෝජිත සැපයුම් සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම යන මූලික සංරචක 3 ඉටු කිරීම සඳහා බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය ස්ථාපනය කර තිබුණි. එහෙත් විවිධ හේතූන් නිසා එහි සංරචක 2ක් අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. | | කටයුතු නිසා සිදුවන බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (EIA) සකසා අවසන්ව ඇත.<br><br>**යෝජිත වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ සංවර්ධනය සඳහා කිඹුලා ඇල (බ්ලූමැන්ඩල්) ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා** සැලසුම් අනුමැතිය ලබාගෙන ඇත. මූලික ශක්‍යතා වාර්තාව සහ ප්‍රදේශයේ ප්‍රවාහන කටයුතු පිළබඳ අධ්‍යයනය වාර්තාව ලබා ගෙන ඇත.<br><br>**යෝජිත සැපයුම් හා සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම්** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය බවට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත් අතර එය සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ඉන් අනතුරුව පාරිසරික / මූල්‍ය බලපෑම් සම්බන්ධව අධ්‍යයන වාර්තාවන් සහ ප්‍රදේශයේ ප්‍රවාහන කටයුතු පිළිබඳ අධ්‍යයන වාර්තාව ලබා ගැනීමට කටයුතු කරන ලදි. |
| (ආ) | සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය යටතේ ජපන් ආධාර උපයෝගී කරගෙන, කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගවල පවතින අධික රථවාහන තදබදයට දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කුළුණු මත ඉහලින් දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමන පද්ධති ජාලයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර එහි මූලික කටයුතු සිදුකිරීම සඳහා JICA අරමුදල් වලින් රු.මිලියන 1791 ක්ද භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු.මිලියන 573 ක් වශයෙන් රු.මිලියන 2,364 ක් වැයකර තිබුණි. එහෙත් මෙකී ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය වී තිබූ බැවින් සිදුකරන ලද වියදම් නිශ්ඵල වියදම් බවට පත් වී තිබුණි. එසේම මෙකී ව්‍යාපෘතිය අතහැර දැමීම නිසා ශ්‍රී ලංකා රජයට රු.බිලියන 5 ක පමණ වන්දියක් ගෙවීමට සිදුවිය හැකි බව අනාවරණය වී තිබුණි. | වියීමත් මූල්‍ය හා ආර්ථික ඇගයීමකින් පසුව පිළිගත හැකි සාධක මත මෙවැනි තීරණ ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රසම්පාදන කටයුතුවලින් පසු තෝරාගන්නා ලද උපදේශන සේවා ආයතනය මගින් සැලසුම්කරණයන් සිදුකරන අතරතුර දැනට පවතින රජය මගින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත මෙම ව්‍යාපෘතියේ කටයුතු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විද්‍යා හා තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාලඹේ, හෝමාගම, කඩුවෙල අතුරුගිරිය යන නගර පිහිටි ප්‍රදේශය, කලාප 05 කට වෙන්කර සංවර්ධනය කිරීමට අපේක්‍ෂිතව පැවති අතර මෙය 2017 මාර්තු 01 දින ආරම්භ කර 2023 මාර්තු 01 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යමණ්ඩල වැටුප් හා දීමනා සහ අනෙකුත් මෙහෙයුම් වියදම් ලෙස 2017 හා 2018 වර්ෂවලදී රු.66,208,697 ක්ද 2019 වර්ෂයේදි තවත් රු.48,229,253 ක්ද වැයකර තිබුණි. එහෙත් විද්‍යා හා තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර ඇති බැවින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අදාල කාලසීමාව තුල දරන ලද වියදම නිෂ්ඵල වියදමක් තිබුණි. | ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ආයෝජන අවදානම අවම වන අයුරින් හා මහජනතාවට ප්‍රතිලාභ ලැබෙන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ස්ථාපිත කරන ලද ව්‍යාපෘතියකි. ඒ අනුව මෙම ව්‍යාපෘතියට අදාල විෂය පථය ක්‍රියාත්මක කිරීමට අදාල යටිතල පහසුකම් සැපයීමට ව්‍යාපෘතින් 04ක් ක්‍රියාවට නංවන ලදි.<br>එම ව්‍යාපෘති වලින් දෙකක් මේ වන විට වැඩ අවසන් කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති 2 වැඩ මෙම වසර තුල අවසන් කිරීමට නියමිතව ඇත.<br>කෙසේ වෙතත්, 2020.09.30 දින වන විට මම ව්‍යාපෘතියේද ව්‍යාපෘති කාර්යන් අවසන් කර ව්‍යාපෘති කාර්යන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනුලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------- |
| (අ) | මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂය වෙනුවෙන් වෙන්කර තිබුණු මුදල් වලින් රු.8,585,750,044 ක් එනම් ප්‍රතිපාදනයෙන් සියයට 81 ක් වැයකර තිබුණි. නමුත් වර්ෂය තුල නිම කිරීමට නියමිතව තිබුණු කැළණිය අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යයෙහි භෞතික ප්‍රගතිය සියයට 29 ක් වූ අතර අරුවක්කාලු අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 30 ක් පමණක් විය. එමෙන්ම 2019 වර්ෂයේ නිමකල යුතු බවට සැලසුම් කර තිබුණු පලාවි සිට අරුවක්කාලු දක්වා දුම්රිය මාර්ග සම්බන්ධතාවය වැඩිදියුණු කිරිමේ කාර්යයද සැලසුම් කල පරිදි සිදු කර නොතිබුණි. එ.ජ. ඩොලර් 8,271,224 ක් වටිනා දුම්රිය එන්ජින් ඒකක 4 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට | ව්‍යාපෘතියෙහි එක් එක් කාර්යයන් ඉටු කළ යුතු ආකාරය ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ඉටු කිරීමටත් ඒ අනුව සැලසුම් කල කාලය තුළ වත්කම් නිශ්කාර්යව නොතබා භාවිතා කිරීමටත් ක්‍රියා කළ යුතුය. එසේම රජයේ මුදල් නිශ්කාර්යව ආයෝජනය කිරීමෙන් වන අලාභයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. | කසල බැහැර කිරීමේ කටයුතු එවකට කොළඹ නගරයේ පැවති කසල බැහැර කිරීමේ උග්‍රතත්ත්වයට පිලියමක් වශයෙන් තාවකාලිකව එම කසල අරුවක්කාලු කසල රඳවනයට දැමීමට කටයුතු කරන ලදී. ඉන් පසුව එම කසල කෙරවලපිටිය කසල අංගනයට ගෙනයාමට තීරණය කල බැවින් අරුවක්කාලු කසල අංගනයට කසල ගෙන යාම නතර කරන ලදී.<br>පලාවී සිට අරුවක්කාලු දක්වා දුම්රිය මාර්ගය සෑදීම සඳහා Insee සමාගම හා අප අතර නිශ්චිත එකගතාවයකට නොපැමිණි බැවින් එම කටයුතු ආරම්භ වීම ප්‍රමාද වන ලදී. |

| | | | |
|---|---|---|---|
| | ආනයනය කර තිබුනු නමුත් එමගින් අපද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා අවශ්‍ය , අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34 ක් සහ බහාලුම් පෙට්ටි 94 ක් ප්‍රසම්පාදනය කරගැනීම ප්‍රමාද වී තිබුණි. මෙම නිසා මිලටගත් දුම්රිය ඇන්ජිම් පවා වර්ෂයකට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව තිබුණි. | | අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34ක් ගෙන ඒම සඳහා 2018 වර්ෂයේ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරගත් අතර එහි කොන්දේසියකට අනුව නිෂ්පාදනය ආරම්භ කල යුත්තේ ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබුණු පසුවය. නිෂ්පාදකයන් විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික සැලසුම් වල ඇති දෝෂ හේතුවෙන් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නැත. එසේ හෙයින් අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34 ගෙන ඒම ප්‍රමාද වී ඇත.<br>කන්ටේනර් පෙට්ටි 94ක් සැපයීම සඳහා ඇති ගිවිසුම අත්සන් කර ඇති අතර ඒවා 2020 වර්ෂය අවසානයේදී ලැබීමට නියමිතව තිබුනද ඒවා සැපයූ පසු එම කන්ටේනර් පෙට්ටි රඳවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් දැනට සාදා නොමැති හෙයින් ඒවා ගෙන්වීම ප්‍රමාද කරන ලෙස අප විසින් සැපයුම්කරුට දන්වන ලදී. කෙසේ හෝ කන්ටේනර් පෙට්ටි 94 මෙම වර්ෂයේ (2021) මාර්තු මස ගෙන ඒමට නියමිතව ඇත. |
| (ආ) | කොළඹ ජල ද්‍රෝනියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩු කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම, කොළඹ නගරය අලංකාර කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එම උපව්‍යාපෘතිය මගින් 2019 වර්ෂයට ඉලක්කගත උපව්‍යාපෘති 09 ක් වෙනුවෙන් වෙන්කල මුදලින් රු.මිලියන 8,676 ක් (94%) වැයකර ලබාගත් | ඌණ කාර්යසාධනයට හේතු සොයා බැලිය යුතුය | මෙම උප ව්‍යාපෘති නවයෙන් හතක් පමණ මහ පරිමාණ ව්‍යාපෘතීන් වන අතර ඉන් ව්‍යාපෘති 4ක් නිර්මාණ හා ඉදිකිරීම් කොන්ත්‍රාත් පැකේජයන් වේ. මහා පරිමාණ ව්‍යාපෘතිවල යාන්ත්‍රික හා විද්‍යුත් උපාංග සඳහා වැඩි භෞතික ප්‍රගතියක් වෙන් කර ඇති අතර 2019 වසර අවසන් වන විට එම උපාංග වලින් කොටසක් පමණක් ආනයනය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රගතිය සියයට 0 සිට සියයට 60 අතර පරාසයක විය. | | එම නිසා බලාපොරොත්තු වූ භෞතික ප්‍රගතිය ළඟාකරගත නොහැකි විය. එසේම 2019.04.21 දින සිදුවූ පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසු ඇති වූ බාධාවන්ද සෘජුවම ප්‍රගතිය ළඟාකර ගැනීමට නොහැකිවීමට<br>බලපෑ සාධකයකි. |
| (ඇ) | පොදු ප්‍රවාහන සේවා ප්‍රවර්ධනය සඳහා බස් සේවාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් 2019 වර්ෂය තුල කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ඇතුලත බස් ප්‍රවාහන මංතීරු පද්ධතිය ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර<br><br>තිබුණු නමුත් ,වර්ෂාවසානය වන විට කි.මී. 40 ක ධාවන මංතීරු සඳහා පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. නමුත් මේ සඳහා වෙන්කර තිබුණු මුදලින් රු. මිලියන 571.14 ක් එනම් සියයට 71 ක මුදලක් වැයකර තිබුණි. කඩවත බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරිම - අදියර 2 සඳහා රු.172,769,315 ක් වෙන්කර තිබුණු අතර අදාල ඉදිකිරිම් කොන්ත්‍රාත්තුව ආයතනයකට භාරදීමේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. පොල්දූව අතුරු මාර්ගය ඉදිකිරිම අදියර III සඳහා රු.445,716,038 ක් වෙන්කර තිබුනු නමුත් එයද නිම කිරිමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත 2019 වර්ෂයේදි මෙම ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල වැටුප් හා අනෙකුත් මෙහෙයුම් හා නඩත්තු වියදම් වෙනුවෙන් රු.මිලියන 51.8 ක් වැය කර තිබුණි. | සැලසුම්කල වැඩකටයුතු නියමිත කාලරාමුව තුල ඉටුකර අවසන් කල යුතුය. | මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන වශයෙන්ම පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.<br><br>01. බස් ප්‍රවාහන මංතීරු පද්ධති ක්‍රියාත්මක කිරීම<br>02. කඩවත බහුමාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම අදියර 1 හා අදියර 2<br>03. පොල්දූව අතුරු මාර්ගය ඉදිකිරීම අධියර 3<br>04.රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන මඟින් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම<br>ඒ අනුව මේ වන විට පොල්දූව පාර අදියර 3 යටතේ ඉදිකිරීම් කටයුතු අවශ්‍ය අවසන් අදියරට පැමිණ ඇති අතර කඩවත බහුමාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම කටයුතුද අවසන් අදියරය පැමිණ ඇත. එමෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන මඟින් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමට අදාල ආයේජකයින් තෝරාගැනීමේ ක්‍රියාවලියද යම් යම් වෙනස් කිරීම් වලට යටත්ව මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කිරීමද සිදුකරමින් පවතී. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගුවන් නගර ව්‍යාපෘතිය හා පරිපාලන නගර ව්‍යාපෘතිය යන ව්‍යාපෘති දෙකෙහි කාර්යමණ්ඩල වැටුප් හා වෙනත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් 2018 වර්ෂය තුළ රු. මිලියන 80.7ක් හා 2019 වර්ෂය තුල රු.මිලියන 29.13 ක් වැයකර තිබුණි. එහෙත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට පෙර එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් විධිමත් ශක්‍යතා අධ්‍යනයක් හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් සිදුවන පරිසර බලපෑම තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි. එසේම ව්‍යාපෘති 02 න් සැලසුම් කල කාර්යයන් කිරිම සඳහා ආයෝජකයින් සොයාගෙන නොතිබු බැවින් මෙම ව්‍යාපෘතිද මුළු මනින්ම භාණ්ඩාගාරයේ අරමුදල් මත යැපෙමින් පැවතුන අතර නිශ්චිත සැලසුම් නොමැතිව ඉතා මන්දගාමී ලෙස ක්‍රියාත්මකව පැවතුණි. මෙම වාර්තාව නිකුත් වන අවස්ථාව වන විට ව්‍යාපෘති දෙක නතර කිරීමට තීරණය කර තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට පෙර එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් විධිමත් ශක්‍යතා අධ්‍යනයක් කළ යුතු අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් සිදුවන පරිසර බලපෑම සඳහාද තක්සේරු වාර්තා ලබාගත යුතුවේ. තවද ආයෝජකයින් සොයා ගැනීමෙන් තොරව ව්‍යාපෘති ආරම්භ නොකල යුතුය. | මෙම ව්‍යාපෘති දෙකද අමාත්‍ය මණ්ඩල අනුමැතින්ට අනුව ස්ථාපිත කරන ලද ව්‍යාපෘති දෙකක් වේ. එම ව්‍යාපෘති දෙක මඟින් මූලිකව ව්‍යාපෘති සැලසුම් කිරීමේ කාර්යය සිදුකිරීමට කටයුතු කර තිබූ නමුත් එහි අරමුණු අපේක්ෂා කල පරිදි ඉටුනොවීම මත ව්‍යාපෘති කාර්යාල 2020.09.30 දින අවසන් කර ඇත. එම ව්‍යාපෘති මඟින් කල ව්‍යාපෘති කාර්යයන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දි ඇත. |

## 3.6 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මහාපරිමාණ ඉදිකිරිම් සම්බන්ධ උප ව්‍යාපෘති, එම ව්‍යාපෘතිය ආරම්භයේදීම ක්‍රියාත්මක කිරිමට කටයුතු නොකර වසර 06 කට ආසන්න කාලයක් ගතවීමෙන් පසු | මනා අධීක්ෂණයක් යටතේ නියමිත කාලය තුළ උප ව්‍යාපෘති කඩිනමින් නිමකිරිමට කටයුතු කල යුතුය. | මෙම ව්‍යාපෘතියේ මුල් අදියර වූයේ අධ්‍යයන කටයුතු සිදුකිරීම සහ ඒ තුලින් ඇවැසි උප ව්‍යාපෘතීන් හඳුනා ගැනීමත්ය. ඉන් අනතුරුව උප ව්‍යාපෘතින් සඳහා අවශ්‍ය වන ඉඩම් අත්පත් කර |

ආරම්භ කිරීමට කටයුතු කර තිබුණි. එම නිසා සමස්ත ව්‍යාපෘතිය නියමිත කාලය තුළ නිමකිරීමට නොහැකි වීම නිසා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදුවී තිබුණි. එසේම සංරචක 01 යටතේ පැවති උප ව්‍යාපෘති 35 න් උප ව්‍යාපෘතින් 12 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටද ඉදිකිරීම් අදියරේ පැවති අතර තවදුරටත් සම්පූර්ණකල යුතුව පැවති මෙකී උපව්‍යාපෘති සියල්ලම පාහේ මහා පරිමාණ උප ව්‍යාපෘති විය. මෙම උප ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත මුළු කොන්ත්‍රාත් පිරිවැය ආසන්න වශයෙන් රු.මිලියන 15,865 ක් විය.

ගැනීම සහ නැවත පදිංචි කිරීමත් උප ව්‍යාපෘති වලට විශේෂිත වූ පාරිසරික හා සමාජීය අධ්‍යයනයන් කිරීමත් සිදුවිය. මේ සඳහා සැලකිය යුතු කාලයක් ගතවිය. එම කටයුතු සිදුකරනු ලැබුවේ ව්‍යාපෘතිය අනුමත වී උප ව්‍යාපෘතින් හඳුනාගැනීමෙන් පසුවය.

මෙම හඳුනාගත් මහා පරිමාණ උප ව්‍යාපෘතින්ගේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම අනුගත විය යුතු වැදගත් පියවර කිහිපයක් ඇත. එනම්, මූලිකවම රජයේ හා ලෝක බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කලයුතු අතර ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ජල විද්‍යාත්මක හා භූ විද්‍යාත්මක සමීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව සවිස්තරාත්මක සැලසුම් සකස් කල යුතුය. එසේම මෙම ව්‍යාපෘතින්ගෙන් බොහොමයක පදනම, පිහිටිගල (Bed rock) දක්වා දිවෙන බැවින් භූ විද්‍යාත්මක සමීක්ෂණ මගින් ලබාගත් නිරීක්ෂණ පදනම්ව සැලසුම් සකස් කිරීමට සිදුවේ.

එසේම මෙම මහා පරිමාණ ව්‍යාපෘති කොළඹ අගනගරය අවට, ඉතා ජනාකීර්ණ ප්‍රදේශවල පිහිටා තිබීම නිසා, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කිරීමට සිදුවේ. ඉඩම් අත්පත් කර ගැනීම් ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටුවේ (LARC) හා ඉඩම් අත්පත් කර කැනීමේ ප්‍රතිස්ථාපනය කිරීමේ විශේෂ කමිටුවේ Super LARC) ක්‍රමවේදයන්ට යටත්ව කටයුතු සිදුකිරීමට සිදුවිය.

එම මහා පරිමාණ ව්‍යාපෘතිවල ඉදිකරීම් කටයුතු සඳහා අවශ්‍ය අනුමතීන් ලබා ගැනීමට

| | | |
|---|---|---|
| | | හැකිවූයේ, මෙම අත්‍යාවශ්‍ය අධ්‍යයනයන් හා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම වීමෙන් පසුවය. |

**3.7** **වෙනත් නිරීක්ෂණ**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බස්නාහිර කලාපයේ මහනගර සැලසුම්කිරීමේ ව්‍යාපෘතිය 2015 මැයි මස ආරම්භ කරන ලද අතර එය 2017 සැප්තැම්බර් මස අවසානය වන තෙක් පුරා වසර 02 කට වැඩි කාලයක් ක්‍රියාත්මකව පැවතුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබුණු මුළු මුදල රු.330,226,769 ක් විය. කෙසේවුවද 2018 වර්ෂය තුල රු.10,224,492 ක හා 2019 වර්ෂය තුල 19,453,589 ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා, මෙහෙයුම් වියදම් ලෙස වියදම් දරමින් බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය නමින් නව ව්‍යාපෘතියක් ලෙස පැරණි ව්‍යාපෘතියම ඉදිරියට පවත්වාගෙන ගොස් තිබුණි. 2020 සැප්තැම්බර් 30 දින මෙම ව්‍යාපෘතියද වසා දැමීමට කටයුතු කර තිබුණි. | ව්‍යාපෘතිය නිමකරන කාල රාමුවක් හෝ ව්‍යාපෘතිය මඟින් සිදුකල යුතු විශේෂ කාර්යයක් නොමැතිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නොකළ යුතු අතර කලාප නගර සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර තිබේනම් එම සැලසුම් ප්‍රසිද්ධියට පත් කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම සැලසුම් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් සැලසුම් සකස් කිරීමෙන් පසු එම ව්‍යාපෘති කායර්යයන් අඩුකර සුළු කාර්ය මණ්ඩලයක් මඟින් මහානගර සැලසුම් මඟින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සහයෝගය ලබා දීම එම කාර්ය මණ්ඩලය මඟින් සිදු කර ඇත. එසේ වෙතත් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද ව්‍යාපෘතින් අවසන් කිරිමත් සමඟ මේ වන විට මෙම සැලසුම් ව්‍යාපෘතිය ද මේ වන විට අවසන් කර ව්‍යාපෘතිය වසා දමා ඇත. |

**3.8** **විදේශ ආධාර ව්‍යාපෘති**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලෝක බැංකුව සහ ආසියානු යටිතල පහසුකම් සංවර්ධන ආයෝජන බැංකුව (AIIB) එක්ව මහකොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩොලර් 700,000 ක මූල්‍යමය ආධාරයක් ප්‍රදානය කිරීමට එකඟ වී එයින් එ.ජ.ඩොලර් 200,000 ක මුදලක් | නැවත විදේශීය ආධාර ලබාගත හැකි ක්‍රියාමාර්ගයක් ගෙන ව්‍යාපෘතිය මඟින් ලඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කළ | අදාල කසල අංගනය ඉදිකිරීමට මූල්‍ය පහසුකම් සැපයීමට ලෝක බැංකුව මුලදී එකඟතාවය පලකර තිබුනත්, පසුව අරමුදල් ලබා දීමට කටයුතු නොකල බැවින් මෙම ව්‍යාපෘතියේ කටයුතු ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් ආරම්භ කිරීමට සිදු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදානය කර තිබුණි. එසේවුවත් අරුවක්කාලු කසල රදවනය ඉදිකිරීමට ප්‍රථම ලෝක බැංකු නිර්දේශයන් අනුව අනුගමනය කල යුතු ක්‍රියාකාරකම් සපුරාලීමට අපොහොසත් වීම ශ්‍රී ලංකා රජයට ලෝක බැංකු ආධාර ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. එම නිසා ව්‍යාපෘතියේ ඉතිරි සියළු වැය බර ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ඉටු කිරීමට සිදුවී තිබුණි. | යුතුය. | |
| (ආ) | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ණය සපයන ලද විදේශීය ආයතනය විසින් රු. මිලියන 27,890.22 කට සමාන එ.ජ.ඩො. මිලියන 213 ක් වූ ණය මුදලක් ප්‍රදානය කිරීමට එකඟතාවය පලකර 2012 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් ව්‍යාපෘතිය ආරම්භ කර වසර 7 ½ ගතවීමෙන් පසුවද උපයෝජනය කර තිබු මුළු ණය ප්‍රමාණය රු.මිලියන 22,224.24කට සමාන එ.ජ.ඩො. මිලියන 144.59 ක් පමණක් විය. 2017 ජුනි 30 වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් ව්‍යාපෘතිය මන්දගාමීව ක්‍රියාත්මක වීම සහ ව්‍යාපෘතියේ උප සංරචකවල අඩු කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය අවස්ථා හතරකදී දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව ඇති නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විට මුළු ණය මුදලින් සියයට 67 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි | නියමිත කාලය තුල ව්‍යාපෘතිය මඟින් සැලසුම් කළ කාර්යයන් නිමකර ප්‍රතිපාදිත ණය මුදල උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | එසේ සිදු වූයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගෙන යාමේදී බලපාන ලද අනපේක්ෂිත මෙම ව්‍යාපෘතියේ පාලනයෙන් බැහැර කරුණු නිසාය.<br>(අ) කොළොන්නාව ඇළ හැරවුම් ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රදේශවාසීන් හා දේශපාලන අධිකාරිය විසින් මතු කරන ලද විරෝධතා,<br>(ආ) මහා පරිමාණ උප ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සිදු කිරීමට නියමිත වූ කාර්යයන් ව්‍යාපෘති අනුමත වී උප ව්‍යාපෘති හඳුනා ගැනීමෙන් පසුව සිදු කිරීමට සිදුවීම.<br>(ඇ) 2019.04.21 සිදුවූ පාස්කු ත්‍රස්ත ප්‍රහාරය හා ඉන් පසු සිදු වූ බාධාවන් වැනි සිදු වීම් ව්‍යාපෘතියේ ඌන උපයෝජනයට බලපාන ලද ප්‍රධාන හේතු වේ. |

## 3.9 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ ව්‍යාපෘති මඟින් ඉටු කරනු ලබන සමාජීය හා ආර්ථිකමය කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරිමේ ප්‍රචාරණ වැඩසටහනක් සකසා ක්‍රියාත්මක කිරිම සඳහා ඉතා අධික පිරිවැයක් යටතේ බාහිර ප්‍රචාරක ආයතනයක සේවය ලබාගැනීමට කටයුතු කර තිබුණි. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලින් මුදල් ගෙන්වා ගෙන රු. 98,680,879 ක මුදලක් වැයකර පුද්ගලික ආයතනයකින් අදාල කාර්යය කරවා ගෙන තිබුණද, අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කටයුතු හා එයින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභය පිළිබඳව ප්‍රචාරය කිරිම වෙනුවට ''යකඩ මිනිසා'' යන තේමාව යටතේ ප්‍රචාරනය සිදුකර තිබුණි. වැයකර තිබුණු මුදල මඟින් මහජනයාට ප්‍රතිලාභයක් ලැබී ඇති බවට වූ සාක්ෂි කිසිවක් නොවීය. එම නිසා මෙම ප්‍රචාරණ වැය ආර්ථික නොවන වැයක් ලෙස විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | අමාත්‍යාංශ මඟින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳ මහජනතාව දැනුවත් කළ යුතුද යන්න පිළිබඳ විශ්ලේෂණය කර ප්‍රචාරක වියදම් කළ යුතුවේ. | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ වාර්ෂිකව රු. බිලියන 50 ට අධික ප්‍රමාණයක් යොදා ගනිමින් සංවර්ධන කටයුතු සිදුකෙරුනු අතර මේ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛ පරිදි රජයේ ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර සියලු ව්‍යාපෘතින් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් සැලසුම් කර තිබිණ. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රමය මඟින් තෝරාගත් ආයතනය මඟින් කරන ලද කටයුතු වල ප්‍රගතිය අනුව අදාල ආයතනය වෙත මේ වන විට රු. මිලියන 78 කට ආසන්න මුදලක් ගෙවා ඇත. එසේ වෙතත් නව රජයට බලයට පත්වීමෙන් පසුව මේ පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කර ඇත. |
| (ආ) | මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියත්මක වු ගුවන්නගර සංවර්ධන ව්‍යාපෘතියේ (Aero City Development) භාවිතය සඳහා, එම ව්‍යාපෘතිය මඟින් සෙත්සිරිපාය II වන අදියරේ ගොඩනැගිලි කොටසක් බෙදා වෙන් කිරීමට රු.2,642,073 ක් වැයකර තිබුණි. එසේ වුවත් පසුව අදාල | අදාල අනාර්ථික වියදම දැරීම සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී වැඩ නිමකිරීමට නියමිතව තිබුණද, ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්ය සාධනයට ළඟාවීම සඳහා කාලය දීර්ඝ කිරීමට අත්‍යාවශ්‍ය කාරණයක් බව සැලසුම් කර තිබුණි. එම |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය සෙත්සිරිපාය ගොඩනැගිල්ලට ගෙන ඒමේ අදහස අත්හැර දැමීම හේතුවෙන් එම ව්‍යාපෘතියට කිසිදු සම්බන්ධයක් නොමැති සහ 2018 වර්ෂයේදී වැඩ නිම කිරීමට අපේක්ෂිතව පැවති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියට එය පවරා තිබුණි. මේ අනුව දරා තිබුණු රු. 2,642,073 ක වියදම, එකී ව්‍යාපෘතිය මගින් නිශ්කාර්යව පියවා තිබුණි. | | සැලසුමට අනුව කාර්යමණ්ඩල සඳහා අතිරේක කාර්යාල වෙන්කර ගැනීමේ අවශ්‍යතාවයක් පැවතිනි. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු, විශේෂඥ නිලධාරීන් හා ඉංජිනේරු හා අනෙකුත් නිලධාරීන් සංඛ්‍යාවේ වැඩිවීමක් සිදුවීමද රැස්වීම් කාමරයක් සඳහා ඉඩකඩ වෙන්කිරීමද ,කුඩා ප්‍රමාණයේ ලේඛනාගාරයක් හා ගබඩාවක අවශ්‍යතාවය පැවතීමටද ව්‍යාපෘතියේ අබලි ද්‍රව්‍ය ගබඩාකිරීමටද අවශ්‍ය ඉඩකඩ නොවීම නිසා මෙම අමතර කාර්යාල කොටස ලබාගන්නා ලදී. |
| (ඈ) | මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ දියවන්නා ඔය පුළුල් කිරීම සඳහා අත්‍යාවශයම ඉඩම් පමණක් පවරා ගැනීම, පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරිම සහ වන්දි ගෙවීම කඩිනම් කිරිම යනාදි කටයුතු සඳහා අදාල ආයතන ප්‍රමාණවත්, පියවර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් පවරාගෙන තිබුණු එක් ඉඩමකට හිමිකම් කියූ විදේශිය සමාගමක් විසින් වන්දි ගෙවීම ප්‍රමාද වීම මත ආයෝජන ආරවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා රජයට එරෙහිව නඩු පවරා තිබුණි. ගොනුකල නඩුව සඳහා විදේශ නිතී උපදේශකයන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශය විසින් රු.314,783,613 ක මුදලක් වැයකර තිබුණි. | සැලසුමක් සහිතව අත්‍යාවශයම ඉඩම් පමණක් පවරා ගැනීම, පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරිම සහ වන්දි ගෙවීම කඩිනම් කිරිම යනාදි කාර්යයන් සඳහා අදාල ආයතන ප්‍රමාණවත් පියවරගත යුතුය. | මෙම නඩුවට ප්‍රශ්නගත ඉඩම් කොටස ජල රැඳවුම් කලාපයක් ලෙස තැබීමට සංස්ථාව විසින් 2000.07.05 වන දිනැති ලිපියෙන් මෙම ඉඩමේ මුල් සංවර්ධනකරු වූ ඉලෙක්ට්‍රෝ හොලිඩේ රෙසෝට් ලිමිටඩ් ආයතනය වෙත දන්වා ඇත. එසේ වුවත් 2010 වසරේ මෙම සංස්ථාව විසින් ජල රැඳවුම් කලාපයක් ලෙස තැබීමට නිර්දේශ කරන ලද ඉඩම් කොටස මොන්ට්‍රෝස් සමාගම වෙත ඉහත සඳහන් කරන ලද ආයතනය විසින් විකුණා ඇත.<br><br>ඒ අනුව, මෙම ඉඩම සඳහා අදාල ආයතනය විසින් GBP 338,162.34 ක මුදලක් ඉඩමේ වන්දි ලෙස ඉල්ලා ගොනු කරන ලද ABR/16/25 දරණ නඩුවේ තීන්දුව 2020.03.05 දින දන්වා තිබූ අතර, එහිදි ශ්‍රී ලංකා ජනරජය විසින් |

| | | |
|---|---|---|
| | | ගන්නා ලද මූලික විරෝධතාවයන් අනුව මොන්ට්‍රෝස් ඩිවලොප්මන්ට් (පෞද්ගලික) සමාගම පවරා තිබූ නඩුව නිශ්ප්‍රභා කරමින් ශ්‍රී ලංකාවට වාසි සහගත ලෙස තින්දුව ප්‍රකාශයට පත් කෙරිණි.<br><br>කෙසේ වෙතත් අදාළ ආයතනය විසින් නැවත අභියවනයක් ගොනුකර ඇති අතර ඒ සඳහා දළ වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.45ක් පමණ වැය විය හැකි බව නිතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.<br><br>මේ වන විට අභියාචනාව සඳහාද ශ්‍රී ලංකා රජය මඟින් ඉදිරිපත් කරන ලද අදාල අභියාචනා තීන්දුව ශ්‍රී ලංකා රජයට වාසි සහගත ලෙස අවසන් වී ඇත. |

**3.10** **කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) කොන්ත්‍රාත් පදනම මත කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන විශේෂඥ තනතුරේ කටයුතු කල නිලධාරියාට පශ්චාත් උපාධි හැදෑරිම සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු.150,000 ක් ව්‍යාපෘති අරමුදලින් නීත්‍යානුකූල නොවන ලෙස ගෙවීම් කර තිබූ අතර එකී මුදල අයකර ගැනීමට විධිමත් පියවර අමාත්‍යාංශය මඟින් ගෙන නොතිබුණි. | නීත්‍යානුකූල නොවන ගෙවීම් සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන විශේෂඥ පශ්චාත් උපාධි පාඨමාලාවවක් හැදෑරීම සඳහා ව්‍යාපෘතියේ අරමුදල් මඟින් ගෙවීම් කර ඇති අතර මෙම නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිට ද්විතිය පදනමින් මෙම ව්‍යාපෘතියේ සේවයට බඳවාගෙන ඇත. තවද මෙම නිලධාරියාට මීට පෙර ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ |

| | | | |
|---|---|---|---|
| | | | යෙදී සිටියදී කිසියම් පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීමට පාඨමාලා ගාස්තුවක් ගෙවා නොමැති බව තහවුරු කරගෙන ඇත. මේ සම්බන්ධයෙන් 2019.06.07 දින පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. |
| (ආ) | 2011 දෙසැම්බර් 12 දිනැති අංක 46 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ, අර්ධ කාලීන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා 1/3 ක දීමනා ගෙවීමේදී ඒ සඳහා අනෙකුත් දීමනා හැර නිලධාරීන්ගේ ව්‍යාපෘති තනතුරුට අදාළ මූලික වැටුප පදනම් කරගෙන නොතිබුණි. එහෙත් මූලික වැටුප හා අනෙකුත් දීමනා ඇතුලත්ව 1/3 ක දීමනාව ගණනය කර වැටුප් ගෙවීම නිසා අර්ධකාලීනව සේවය කල කාර්යමණ්ඩලයේ නිලධාරින් වෙත රු.10,832,729 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. එසේ වුවත් එම මුදල් අයකර ගැනීමට අමාත්‍යාංශය මගින් විධිමත් පියවර ගෙන නොතිබුණි. | වැඩිපු ගෙවා ඇති මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. | කොළඹ අගනගර ආශ්‍රිත නාගිරික සංවර්ධන ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයට 1/3 දීමනා ගෙවීමේදී එම නිළධාරියාට හිමි දීමනාද ඇතුලත් කර අදාළ ගෙවීම් කර ඇති බව විගනකාධිපති විසින් විගණන විමසුම මඟින් දැනුම්දීමෙන් අනතුරුව මේ සම්බන්ධව චක්‍රලේඛ නිකුත් කර ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කරන ලදි. ඒ අනුව, 2016.07.26 දිනැති එම දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීමට අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 මඟින් විධිවාධාන සලසා තිබූ බව දැනුම් දී ඇත. එසේ වෙතත් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 විධිවිධානයන්ට අනුව අදාල ගෙවීම් කල නොහැකි නිසා චක්‍රලේඛ ගෙවීම් නැවැත්වීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධනය සඳහා පමණක් 3K ව්‍යාපෘතිය නමින් කරගෙන ගිය ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති පිරිවැය වැරදි ලෙස අර්ථකථනය කර, කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකුට තමන් එතෙක් ලබමින් සිටි වැටුපට වඩා ඉහල වැටුපක් ලැබිය යුතු බවට අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතියක් ලබාගෙන චක්‍රලේඛ උපදෙස් අභිබවා හිඟ වැටුප් ලෙස රු.1,906,200 ක මුදලක් ලබාගෙන තිබුණි. එකී වැරදි සහගත ගෙවීම අයකර ගැනීමට අමාත්‍යාංශය මගින් මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. | වැරදි තොරතුරු ඉදිරිපත් කර ගෙවීම් ලබාගත් නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම වැටුප් ගෙවීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අංක DMS/7777/GCVT හා 2017.10.02 දිනැති ලිපිය මඟින් පැහැදිලි කිරීම් ලබා දී ඇත. ඒ අනුව, 3K ව්‍යාපෘතිය සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කර දී ඇති බවත්, කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ පිරිවැය පදනම් කරගෙන වැටුප් ගෙවන ලෙස උපදෙස් ලබාදී ඇත. |
| (ඈ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 හා 05 ඡේදවලට පටහැනිව අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) විසින් ප්‍රවාහන දීමනා ලෙස මාසිකව රු.50,000 ක් ලබා ගනිමින්ම, ව්‍යාපෘතිවල වාහන රාජකාරි හා පෞද්ගලික ගමන් සඳහා භාවිතා කර තිබුණි. එම නිසා ඔහු විසින් ප්‍රවාහන දීමනා ලෙස ලබාගත් රු.340,000 ක් ආපසු අදාල නිලධාරියාගෙන් අයකරගත යුතු වුවත් එකී මුදලෙන් රු. 150,000 ක් පමණක් ආපසු අයකරගෙන තිබුණි. ඉතිරි රු.190,000 ක මුදල මෙතෙක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ගෙවීම නීතියානුකූල නොවන ගෙවීමක් බැවින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් කඩිනමින් එකී මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු බවට නිර්දේශ කෙරේ. | අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්ගෙන් නැවත අයකර ගත යුතු යැයි නියම කරන ලද රු. 340,000 ක මුදලින් රු. 150,000 ක මුදලක් 2017.01.17 දිනැති රජයට ආපසු ගෙවා ඇත. ඒ බව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත දන්වා ඇත. රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව අනුව රාජ්‍ය ගිණුම් කාරක සභාව මඟින් ලැබෙන උපදෙස් අනුව ඉදිරි පියවර ගැනීමට නියමිතය. |
| (ඉ) | හිටපු අමාත්‍යාංශ ලේකම් සහ අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) යන අයගේ නිල වාහන සඳහා ඉන්ධන දීමනා ලබාගනිමින් තිබියදී අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති දෙකකින්ද අංක 01/2016 දරන චක්‍රලේඛය පටහැනිව ඉන්ධන ලබාගෙන තිබුණි. 2015 වසරේ සිට 2016 දෙසැම්බර් දක්වා අමාත්‍යාංශ ලේකම්ගේ වාහනය සඳහා රු.288,200 ක්ද එසේම අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) ගේ නිල වාහනය සඳහා රු. 465,080 ක් වටිනා ඉන්ධන ලබාගෙන තිබූ අතර චක්‍රලේඛනයට පරිබාහිර ලබාගෙන තිබූ ඉන්ධනවල වටිනාකම අයකර ගැනීමට අමාත්‍යාංශය මෙතෙක් කටයුතු කරගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට පරිබාහිරව ලබාගෙන ඇති ඉන්ධන වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුය. | 05/2016 චක්‍රලේඛයේ කරුණු වලට පටහැනි වුවත් නිලධාරියා විසින් සංචිත වාහනය සමඟ ලබාගත් ඉන්ධන වලින් අදාල ක්ෂේත්‍ර රාජකාරී සිදුකර ඇත. මෙය 2020.08.21 දිනැති ලිපියෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. රාජ්‍ය ගිණුම් කාරක සභාව මඟින් ලබාදෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු කිරීමට පියවර ගැනීමට නියමිතය. |

## 3.11 අවිධිමත් ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.මිලියනයක මාසික පාරිශ්‍රමිකයක් යටතේ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියට ශ්‍රී ලාංකීක උපදේශකවරයෙකු පත්කර තිබුණු අතර ඉකුත් වසර 03 තුල එකී උපදේශකවරයාට රු.මිලියන 37.16 ක් ගෙවීම් කර තිබුණි. එම නිලධාරියාගේ කාර්යසාධනය පිළිබඳව සෑම වසරක් අවසානයේදීම ඇගයීම් කර සේවය දීර්ඝ කිරිමක් සිදුකර නොතිබූ අතර සාමාන්‍යය ක්‍රමවේදයෙන් බැහැරව අවුරුදු 03 ක් සඳහා එකවර පත්වීම් ලබාදී තිබුණි. | නිශ්චිත අරමුණු සහිතව සහ විකල්ප ක්‍රියාමාර්ග ගැන සලකා බලා අඩුම පිරිවැයකින් අරමුණ කරා ලගා වීමට කටයුතු කල යුතුය. විධිමත් අනුමැතියකින් තොරව පාරිශ්‍රමික නොගෙවිය යුතු අතර විධිමත් ලෙස කාර්යසාධන ඇගයීම් නොකර සේවා දීර්ඝ කිරිම්ද නොකළ යුතුය. | ලෝක බැංකු උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. ගිවිසුම් ප්‍රකාරව උපදේශන ගාස්තු ගෙවා ඇත. එබැවින් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමේ අවශ්‍යතාවයක් නොමැත. |
| (ආ) | වරාය නගර ව්‍යාපෘතිය සඳහා කාර්යමණ්ඩලය අනුමත කිරිමේදී සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂක තනතුරු 02 ක් අවශ්‍ය බවට කරුණු දක්වා තනතුරු 02 ක් අනුමත කරගෙන තිබුණු අතර විධිමත් බඳවාගැනීමේ පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව ව්‍යාපෘති සම්බන්ධිකරණය හා නියාමනය යන එකම කාර්යයන් සඳහා අමාත්‍යාංශයේ නිලධාරිනියන් දෙදෙනෙකු අර්ධ කාලීන පදනමින් එම තනතුරු සඳහා පත්කර තිබුණි. 2016 දෙසැම්බර් මස සිට 2019 දෙසැම්බර් දක්වා වසර 03 කුත් මාසයක් සඳහා එකී නිලධාරිනියන්ට එකතුව රු.4,018,332 මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණද එකී නිලධාරිනියන් දෙදෙනා වරාය නගර ව්‍යාපෘතියෙහි සේවය කල බවට පැමිණිමේ පිටවීමේ වාර්තා ලබා ගෙන නොතිබුණි. අර්ධකාලීනව ව්‍යාපෘතියේ සේවය කල එම නිලධාරිනියන් දෙදෙනා වෙනුවෙන් පූර්ණ කාලීනව ප්‍රයෝජනය සඳහා වරාය නගර ව්‍යාපෘතියේ ඉදිකිරීම් සමාගමෙන් කුලී පදනම මත වාහනයක් සපයා දී තිබු අතර එම වාහනය සඳහා 2019 වර්ෂ අවසානය වන විට එම සමාගම විසින් ගෙවා තිබු මුළු මුදල රු. 6,314,400 ක් විය. | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිවල කටයුතු සම්බන්ධිකරණය හා නියාමනය කල යුතු අතර ඒ සඳහා අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ නිලධාරියෙකුට එම කාර්යය පැවරිය යුතුය. | විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන විමසුමට අනුව, අමාත්‍යාංශය විසින් කමිටුවක් පත්කර ඇත. විමර්ශන කටයුතු වලින් පසු අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

**3.12** වංචනික ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් මාසයේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් වාහන 4 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ, වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියට ලබා දී තිබුණු අතර ඉන් එක් වාහනයක් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා වෙත වෙන්කර එකී වාහනය සඳහා ඉන්ධන දීමනාවක්ද ගෙවා තිබුණි. තවද ව්‍යාපෘති අධ්‍යක්‍ෂකවරයා විසින් වරායනගර ඉදිකිරීම් සමාගමෙන්ද තවත් වාහනයක් ලබාගෙන වාහන දෙකක් භාවිතා කර තිබුණි. එසේම ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්‍ෂකවරුන් දෙදෙනෙක් විසින් ඔවුන්ගේ භාර්යාවන්ගේ නම් වලින් ලියාපදිංචි කර තිබුණු වාහන ව්‍යාපෘති කටයුතු වලට කුලී පදනම මත යොදවා ගත් බවට සඳහන් කරමින් රු.මිලියන 3 කට අධික මුදලක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සමාගමෙන් ලබාගෙන තිබුණි. | අදාල නිරීක්ෂණ සම්බන්ධයෙන් විමර්ශන පවත්වා වැඩිපුර ගෙවීමක් සිදුකර ඇත්නම් එම මුදල් නැවත අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධව පරීක්ෂණය කිරීම සඳහා විමර්ශන නිලධාරී මහතෙකු පත්කර ඇති අතර, එම වාර්තාව ලැබීමෙන් පසු අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

**4.** තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නාගරික සහ අනෙකුත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම තුලින් නගරවල අහිතකර ඒක පුද්ගල පාරිසරික බලපෑම අවම කිරීම මහකොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්කය විය. එහෙත් එම ව්‍යාපෘතියේ වැඩකටයුතු නිමකිරීමේ මන්දගාමී බව නිසා එම ඉලක්කය කරා ලගාවීමට අදාල ව්‍යාපෘතියට නොහැකිව තිබුණි. | ඌණ කාර්යසාධනයට හේතු සොයා බලා කාර්යයන් කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | 2020 වර්ෂය තුල නිම කිරීමට නියමිතව තිබුණු කැලණිය අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානයේ ඉදිකිරීමේ කාර්යයෙහි භෞතික ප්‍රගතිය 29% ක් වීමට ප්‍රධාන වශයෙන් බලපාන ලද කරුණ වුයේ,<br>ප්‍රදේශ වාසීන් විසින් ඉදිකිරීමේ කටයුතු කෙරෙහි වරින් වර දක්වන ලද විරෝධයයි. මෙම හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීම කණු මත සිදුවන බැවින් කණු |

1014ක් ස්ථාපනය කිරීමට යෝජිතව ඇති අතර දැඩි විරෝධතා හේතුවෙන් මෙම කටයුත්ත අඩාල වී නියමිත දින වකවානුවක් නොමැතිව කල් ගත විය.

එසේම 2019.04.21 දින සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරිම් කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම මහත් අසීරු විය. මෙම කරුණු හේතුවෙන් මෙහි ඉදිකිරීම් කටයුතු බලාපොරොත්තු වූ දින වලට අවසන් කර ගැනීමට අපහසු වී ඇති බැවින් ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතියට දැඩි බලපෑමක් සිදු වී ඇත.